# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2152/11 - 2019 දෙසැම්බර් මස 03 වැනි අඟහරුවාදා - 2019.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 07/2019 දරන සුරාබදු නිවේදනය

**මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2019 දෙසැම්බර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ;

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ විශේෂ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් තුන්දාහස් අටසියයක් (රු.3,800.00) වන බද්දක් අය විය යුතු යැයි ද ;

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම්කළ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හාරදහස් පනහක් (රු.4,050.00) වන බද්දක් අය විය යුතු යැයි ද ;

(3) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ ''විදේශීය'' ස්ප්‍රීතු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හාරදහස් එකසිය පනහක් (රු. 4,150.00) වන බද්දක් අයවිය යුතු යැයි ද ;

(4) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් තුන්දහස් දෙසීයයක් (රු. 3,200.00) වන බද්දක් අයවිය යුතු යැයි ද ;

(5) රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණුකොට තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑම පැළෑටියකින් ලබා ගන්නා ස්වභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් තුන්දහස් දෙසීයයක් (රු. 3,200.00) වන බද්දක් අයවිය යුතු යැයි ද ;

1A - PG 4783 — 592 (2019/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(6) ඉහත 1 සිට 5 දක්වා (1-5) නිශ්චිතව සඳහන් කර ඇති බද්ද, අපනයනය කරනු ලබන මත්පැන් කවර ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුව ද එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(7) ඉහත අයිතම 4 යටතේ නිශ්චිතව සඳහන් කර ඇති බද්ද, යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද මත්පැන් ඕනෑම ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(8) 2019 මාර්තු 05 දිනැති අංක 2113/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 01/2019 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 03 වැනි දින,
කොළඹ 01.
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

12 - 645

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.